# ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව.
## ඇබෑර්තු

ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ පහත සඳහන් තනතුර සඳහා බඳවා ගැනීම පිණිස, ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| තනතුර | ශ්‍රේණිය | වැටුප |
|---|---|---|
| ආරක්ෂක සහකාර | සී-4 | රු.53790 -15x620- 63090 |

පත්වීමේ ස්වභාවය - ස්ථිර පදනම

**තනතුරට අවශ්‍ය සුදුසුකම්**

1. භාෂාව සහ අංක ගණිතය/වාණිජ අංක ගණිතය හෝ ගණිතය සඳහා සාමාර්ථ සහිතව අ.පො.ස (සා.පෙළ) විභාගයේ විෂයයන් හයක් (06) දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්වී තිබීම.
2. අඩි 5 අඟල් 4 ක අවම උසක් සහ පපුව අඟල් 30 ක් (හුස්ම යැවීමෙන් පසු) තිබිය යුතුය.
3. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 26 ට නොවැඩි විය යුතුය. (පොලීසිය හෝ ත්‍රිවිධ හමුදාවේ සේවය කරන ලද අයදුම්කරුවන්ට අවම වයස් සීමාව අවුරුදු 40 වේ.)
4. ලිඛිත පරීක්ෂණය/ විභාගය සමත් විය යුතුය.

**පොදු අවශ්‍යතා**

❖ මෙම තනතුරේ රාජකාරි කිරීමට සහ වගකීම් දැරීමට ශාරීරික සහ මානසික නිරෝගීතාවය පැවතිය යුතුය.

❖ රටේ ඕනෑම ප්‍රදේශක සේවය කිරීමට සහ අවශ්‍ය වුවහොත් මුර සේවයේ යෙදීමට හැකි විය යුතුය.

**අමතර ප්‍රතිලාභ**

සංස්ථාවේ වෛද්‍යාධාර ක්‍රමය යටතේ නොමිලයේ වෛද්‍යාධාර පහසුකම්, නිවාස ණය පහසුකම් , වාහන ණය පහසුකම් යනාදිය හිමිවනු ඇත.

සේවක අර්ථසාධක අරමුදල් සාමාජිකත්වය සඳහා සේවකයා තම වැටුපෙන් 10% ක ප්‍රමාණයකින් දායක විය යුතු අතර, ඒ සඳහා සංස්ථාවෙන් 15% ක ප්‍රමාණයක් ගෙවනු ලැබේ. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල වෙනුවෙන් වැටුපෙන් 3% ක ප්‍රමාණයක් සංස්ථාවෙන් ගෙවනු ලැබේ.

**අයදුම්කිරීමේ පිළිවෙල.**

සංස්ථා වෙබ් අඩවියේ (www.ceypetco.gov.lk ) පළ කර ඇති පොදු අයදුම්පත්‍රයේ ආකෘතිය භාවිතා කර ඔබ විසින් සකස් කරන ලද අයදුම්පත්‍රය සමඟ අධ්‍යාපන සහතිකවල පිටපත් අමුණා ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සහිතව විස්තරාත්මක අයදුම්පතක් ඉදිරිපත් කළ යුතු වේ.

රජයේ දෙපාර්තමේන්තුවල හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත්, අදාළ ආයතන ප්‍රධානියා මගින් යොමු කළ යුතු අතර, ඔවුන් විසින් අදාළ අයදුම්කරු මෙම තනතුරට තෝරා ගනු ලැබුවහොත්, තම ආයතනයෙන් මුදා හැරීමට ඇති හැකියාව සඳහන් කළ යුතුය.

අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ තනතුරු නාමය සඳහන් කර 2018.05.08 දිනට හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ එවිය යුතුය.

ඉහත අවශ්‍යතාවන්ට නොගැලපෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

වැ.බ. කළමනාකාර අධ්‍යක්ෂ
ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව.
අංක.609, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 09.
2018.04.25 දින,
එස්/එස්